Article 13

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 23-10-2020 |
|---|---|---|

පැමිණිලි පාර්ශවය : ඩී.එම් ඥාණවතී මිය,
අධිකරණය ඉදිරිපිට මාර්ගය,
82/01, ප්‍රදීප් නිවස, රුහුණු දනව්ව.

වගඋත්තර පාර්ශවය : 01. පොලිස් අධිකාරී සුගත් ගලගමගේ මයා,
අධ්‍යක්ෂ (සැපයුම්)
පොලිස් මූලස්ථානය,
කොළඹ.

02. ප්‍ර.පො.ප - එස්.කේ.ඩී ද සිල්වා මයා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
මූලතිව්.

03. උ.පො.ප ජිනදාස මයා,
පොලිස් ස්ථානය,
ගලහ.

<u>පැමිණිලි අංකය : **HRC/639/17**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලි පාර්ශවය විසින් 2017.02.20 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, සියඹලාණ්ඩුව පොලිස් ස්ථානයේ නිලධාරින් විසින් ඒ.එම් සාලිය ප්‍රසන්න වන තම බාලවයස්කාර දරුවා 2015.03.09 දින පාසල අවසන් වී නිවසට එන අතරමගදී නිතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගෙන ශාරීරිකව හා මානසිකව පීඩාවන්ට පත්කර දරුවාගේ අධ්‍යාපනයට හා කීර්තිනාමයට හානි පමුණුවා අසත්‍ය චෝදනා කර, මාධ්‍ය වාර්තා පළකරමින් විශාල අසාධාරණයක් සිදුකරන ලද බවයි.

එසේම තම බාලවයස්කාර සාලිය ප්‍රසන්න යන දරුවා සන්දා මධුෂානි නැමැති බාල වයස්කාර දියණිය දූෂණය කළ බවට ඇගේ මව වන ශසිකා මධුකුමාරි යන අය විසින් අසත්‍ය පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, ඇයගේ සැමියා විසින් එම වරද සිදුකර එයින් බේරීම සඳහා පොලීසිය සමඟ එක්ව


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

කුමන්ත්‍රණය කරමින් තම දරුවා එයට හසුකර ඇති බවත්, තම දරුවා අත්අඩංගුවට ගෙන පහරදී 2015.03.10 දින අධිකරණයට ඉදිරිපත් කොට බන්ධනාගාරගත කළ බවත් සඳහන් කර ඇත. දූෂණයට ලක්කළේ යැයි කී දියණියට උපන් දරුවාගේ ලේ සාම්පල නොගැලපීමෙන් අධිකරණයෙන් තමන්ගේ දරුවා නිදහස් කළ බවත්, වගඋත්තරකරුවන් විසින් අධිකරණය නොමග යවමින් තම දරුවා වරදකට හසුකර ඔහුගේ අනාගතය සම්පූර්ණයෙන්ම විනාශ කළ බවත් සඳහන් කර ඇත. තවද වගඋත්තර පාර්ශවීය සහකාර පොලිස් අධිකාරීවරයා විසින් තමන්ගේ නිවසට පැමිණ දූෂණයට ලක්වූ ගැහැණු දරුවා තම පුත්‍රයාට විවාහ කරදිය යුතු බවට තර්ජණය කළ බවද වැඩිදුරටත් පැමිණිලි පාර්ශවය සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු :-**

මෙම පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවය විසින් 2019.07.12 වන දින පැවැති පරීක්ෂණයෙන් පසු පැමිණිල්ලට අදාළ උදෘත හා ලිඛිත වාර්තා ගොනු කර ඇති අතර, 2019.06.01 දින ප්‍රධාන කාර්යාලයේ පැවැති පරීක්ෂණයේදී වාචික කරුණු ඉදිරිපත් කර ඇත.

03 වන වගඋත්තරකාර පොලිස් පරීක්ෂක ජිනදාස මහතා මූලික පරීක්ෂණයේදී ප්‍රකාශ කර ඇත්තේ, ස්ථානාධිපතිවරයාගෙන් ලද උපදෙස් මත තමන් අපරාධ ස්ථානයට ගොස් පරීක්ෂණ පවත්වා සාලිය නැමැති සැකකරු චෝදනාව කියා දී අත්අඩංගුවට ගත් බවයි.

02 වන වගඋත්තරකාර ප්‍ර.පො.ප සිල්වා මහතා ප්‍රකාශ කර ඇත්තේ, 2015.03.09 වන දින දූෂණයට අදාළව ලද පැමිණිල්ලකට අනුව උ.පො.ප ජිනදාස මහතා විසින් සැකකාර සාලිය නැමැති පාසල් ශිෂ්‍යා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ බවත්, DNA පරීක්ෂණ වාර්තා අනුව මෙම සාලිය ප්‍රසන්න යන අයව නඩුවෙන් මුදා හල බවත්, දැරිය දූෂණය කළ වරද සම්බන්ධයෙන් දියණියගේ පියා අත්අඩංගුවට ගෙන අධිකරණ කටයුතු සිදුකළ බවත්ය. එමෙන්ම පැමිණිලිකාරියගේ පුත්‍රයාට අසාධාරණයක් සිදුව ඇතත්, අධිකරණයෙන් ඔහුට උපරිම සාධාරණය ඉටු වී ඇති බවත් සඳහන් කර ඇත.

2019.07.12 දිනැති පරීක්ෂණයේදී, පොලිස් අධිකාරී සුගත් ගලගමගේ මහතා ප්‍රකාශ කර ඇත්තේ, තමන් විසින් දූෂණයට ලක්වූ දරුවා විවාහ කර ගන්නා ලෙසට පැමිණිලි පාර්ශවයට තර්ජණය නොකළ බවත්, නීතිපතිතුමා විසින් යම් සහනයක් ලබාදෙනු ඇති බවට උපදෙස් ලබාදුන් බවත්ය. ඒ පිළිබඳව වැඩිදුර වාර්තාවක් එවකට සහකාර පොලිස් අධිකාරී (දැනට පොලිස් අධිකාරී) සුගත් ගලගමගේ මහතා විසින් 2019.08.01 වන දින කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකාරියගේ පුත්‍රයා වන ඒ.එම් සාලිය ප්‍රසන්න යන එවකට 15 වන වියේ පසුවූ බාල වයස්කාර දරුවා විසින් වයස අවු 14 ක දැරියක් දූෂණයට ලක්කළ බවට ලැබුණු පැමිණිල්ලකට අනුව 2015.03.09

වන දින වගඋත්තර පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන 2015.03.10 වන දින අධිකරණයට ඉදිරිපත් කර රිමාන්ඩ් බන්ධනාගාර ගතකර ඇති බව අනාවරණය වේ.

දූෂණයට ලක්වූයේ යැයි කියන දියණියගේ මව වන ඩබ්.එම් ශසිකා මධුකුමාරි යන අය විසින් 2015.03.09 වන දින පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, දූෂණයට ලක්ව ඇති දැරියගේ ප්‍රකාශ අනුව 2014 නොවැම්බර් මාසයේ අවසන් කාලයේ පමණ දැරිය දූෂණයට ලක්වී ඇති අතර, ඇය ගැබ්ගෙන ඇති බව දැනගැනීමෙන් අනතුරුව මාස 04 කට පමණ පසුව පැමිණිල්ල ඉදිරිපත් කර ඇති බව අනාවරණය වේ.

දූෂණය සම්බන්ධයෙන් ලැබුනු පැමිණිල්ල සියඹලාණ්ඩුව පොලිස් ස්ථානයේ අපරාධ අංශය වෙත 2015.03.09 වන දින පැය 14.50 ට ලැබී ඇති අතර, එදිනම පැය 16.30 ට ඩී.එම් ඥාණවතී යන පැමිණිලිකාරියගේ පුත්‍රයා වන සාලිය ප්‍රසන්න (අවු.15) දරුවා නිවසේදී අත්අඩංගුවට ගත් බවට උදෘතවල දක්වා ඇත.

එහෙත් පැමිණිලි පාර්ශවය සඳහන් කර ඇත්තේ, සාලිය ප්‍රසන්න බාල වයස්කාර දරුවා පාසල් ඇරී පාපැදියෙන් නිවසට එන අතරමගදී තර්ජණය කර වගඋත්තරකාර නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බවයි.

එසේම පැමිණිලිකාරියගේ පුත්‍රයා වන සාලිය ප්‍රසන්න යන අයට එරෙහිව පැවැති ස්ත්‍රී දූෂණ චෝදනාවෙන් 2016.12.27 වන දින සියඹලාණ්ඩුව මහේස්ත්‍රාත්වරයා විසින් නිදහස් කර මුදාහැර ඇති අතර, දූෂණයට ලක්වූ ගැහැණු දරුවාට උපන් දරුවාගේ ලේ සාම්පල නොගැලපීමෙන් හා ඩී.එන්.ඒ වාර්තාව අනුව එය සිදුවී ඇති බව අනාවරණය වේ.

ස්ත්‍රී දූෂණ චෝදනාවන්ට ලක්ව වසරකුත් මාස 09 කටත් වැඩි කාලයක් පැමිණිලි පාර්ශවයේ පුත්‍රයා වූ අවු. 15 ක බාලවයස්කාර දරුවා අධිකරණ කටයුතු වලට මැදිහත්ව සිට ඇති අතර, සියඹලාණ්ඩුව මහ විදුහලේ සාමාන්‍ය පෙළ සිසුවෙකු වූ ඔහු එම පාසලෙන් ඉවත් කොට වෙනත් පාසලකට යොමුකර ඇතත්, ස්ත්‍රී දූෂණ චෝදනා හේතුවෙන් එම විදුහලේ දරුවන් විසින් මෙම දරුවාට පහරදී ඇති හෙයින් පාසල් අධ්‍යාපනය ඉන් අවසන් වී ඇති අතර, ඉන්පසුව බාහිර අයදුම්කරුවෙකු වශයෙන් අ.පො.ස (සා/පෙළ) විභාගයට ඉදිරිපත්ව ඇති බව අනාවරණය වේ.

වින්දිත දැරිය හා අයගේ මව විසින් සියඹලාණ්ඩුව පොලීසිය වෙත ලබාදෙන ලද පැමිණිල්ලට අනුව චූදිත පාසල් දරුවා අත්අඩංගුවට ගෙන ඇති අතර, ඩී.එන්.ඒ වාර්තා ලැබීමෙන් පසුව චූදිත පාසල් දරුවා 2016.12.27 වන දින නිදහස් වී ඇත. ඉන් අනතුරුව වගඋත්තර පාර්ශවය විසින් වින්දිත දැරියගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර, ඒ අනුව වින්දිත දැරිය කලින් පොලීසියට කරන ලද ප්‍රකාශය අසත්‍ය බව පිළිගෙන ඇත. ඉන් පසු එම දැරිය විසින් දෙන ලද ප්‍රකාශය පදනම් කරගෙන එම දැරිය දූෂණය කිරීමේ වරද සම්බන්ධව එම දැරියගේ පියා 2016.06.16 දින වගඋත්තර නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අතර, ඩී.එන්.ඒ වාර්තා ලැබීමෙන් පසුව වින්දිත

දියණිය ඇයගේ පියා විසින් දූෂණය කර ඇති බවට අනාවරණය වී ඇත. ඊට අදාළ නඩුව විභාග වීමෙන් පසුව 2019.07.30 දින මොණරාගල මහාධිකරණය විසින් චූදිත වැරදිකරු කරමින් වසර 15 ක සිර දඬුවම් හා වන්දි ගෙවන ලෙස නියම කර ඇති බව අනාවරණය වේ.

ඒ අනුව ස්ත්‍රී දූෂණ වරදට කිසිසේත්ම සම්බන්ධයක් නොමැති පැමිණිලිකාරියගේ බාල වයස්කාර දරුවා අත්අඩංගුවට පත්ව ඇති අතර, ඉන් පසුව ඇති වූ තත්වය හමුවේ එම දරුවාගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම විනාශ වී ඇති අතර, තවත් බොහෝ දේ එම දරුවාට අහිමි වී ඇති බව අනාවරණය වේ.

පැමිණිලිකාරිය වගඋත්තර පාර්ශවය වෙත චෝදනා කරන්නේ කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව විධිමත් විමර්ශනයකින් තොරව වරද කළ පාර්ශවයේ අයගේ වුවමනාවට කුමන්ත්‍රණකාරී ලෙස ක්‍රියාකරමින් අධිකරණය නොමග යවමින් කටයුතු කර තම දරුවාගේ අධ්‍යාපනය ඇතුළු සියලු අයිතිවාසිකම් උල්ලංඝනය කළ බවට වේ. ඒ අනුව සිදුවූ අගතිය වෙනුවෙන් වගඋත්තර පාර්ශවයෙන් වන්දි මුදලක් ඉල්ලා ඇති බවද අනාවරණය වේ.

වගඋත්තර පාර්ශවය විසින් ස්ත්‍රී දූෂණයක් සම්බන්ධව ලැබුනු පැමිණිල්ලක් හේතුවෙන් එකී වරද කියා දී පැමිණිලිකාරියගේ පුත්‍රයා 2015.03.09 වන දින අත්අඩංගුවට ගෙන ඇති අතර, ස්ත්‍රී දූෂණය සම්බන්ධව සියඹලාන්ඩුව පොලීසිය වෙත 2015.03.09 වන දින පැය 14.50 ට ලැබී ඇති අතර, නිලධාරීන්ගේ පිටවීම 15.15 ට සටහන් කර ඇත. ඉන් පසුව 16.30 ට සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. ඒ අනුව ස්ත්‍රී දූෂණය පිළිබඳව පැමිණිල්ල ලැබීමෙන් පැයකුත් විනාඩි 40 ක් ඇතුළත සැකකාර බාලවයස්කාර පාසල් ශිෂ්‍යයා අත්අඩංගුවට ගෙන ඇති බව අනාවරණය වේ. මේ කාලය අතරතුර වගඋත්තර පාර්ශවීය පොලිස් නිලධාරීන් විසින් සිදුකරන ලද කිසිදු වෙනත් විමර්ශනයක් නොමැති බවද අනාවරණය වේ.

සැකකාර පාසල් ශිෂ්‍යයා අත්අඩංගුවට ගැනීමෙන් පසුව පැමිණිලිකරු සමඟ වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක ජිනදාස යන අය අපරාධ ස්ථානය පරීක්ෂා කර ඇති අතර, පොලිස් උදෘත වල දැක්වෙන්නේ ලඳු කැලෑවක් තුළ විශාල ලෙස වැඩුනු නුග හා මොර ගස් දෙකක් අතරදී මෙම අපරාධය සිදුවී ඇති බවයි.

සැකකාර ශිෂ්‍යයා අත්අඩංගුවට ගැනීමෙන් පැයකට පසු පැය 17 ට සැකකරුගේ ප්‍රකාශය සටහන් කර ඇති අතර, දූෂණයට ලක්වූවායැයි කියන දැරිය සමඟ කිසිදු සම්බන්ධයෙක් නොතිබූ බවත්, ඒ අනුව චූදිත පාසල් ශිෂ්‍යයා චෝදනා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බවත් දක්වා ඇත. එකී වින්දිත දියණියගේ ප්‍රකාශ වලද සැකකාර දරුවා ඇය සමඟ කිසියම් සම්බන්ධයෙන් පැවැත්වූ බවට කිසිදු කරුණක් ඇතුළත්ව නොමැති බවද අනාවරණය වේ.

වින්දිත දැරිය 2014 නොවැම්බර් මාසයේ දිනයක සැකකාර පාසල් ශිෂ්‍යයා විසින් දූෂණය කළ බවට කියන අතර, එකී පැමිණිල්ල සටහන් කර ඇත්තේ එම දියණිය දරුවෙකු ලැබීමට සිටින බවට දැනගැනීමෙන් මාස 04 කට වඩා වැඩි කාලයකට පසුව වේ. අපරාධය සිදුවන අවස්ථාවේ දැරිය හැඳ

සිටි වස්ත්‍ර හා සැකකාර දරුවා හැඳ සිටි වස්ත්‍ර නඩු භාණ්ඩ වශයෙන් භාරගත් බව පොලිස් උද්ධෘත වල දැක්වෙන අතර ඒවා එම අය ඉදිරිපත් කළ බවට සටහන් තබා ඇත.

කෙසේ නමුත් සැකකාර බාලවයස්කාර ශිෂ්‍යා අත්අඩංගුවට ගත් කාලපරාසය තුළ කිසිදු විමර්ශනයක් වගඋත්තර නිලධාරින් විසින් සිදුකර නොමැති බව අනාවරණය වේ. සැකකාර ශිෂ්‍යාට එරෙහිව ඇති බරපතල අපරාධ චෝදනා සම්බන්ධයෙන් කිසිදු පූර්ණ විමර්ශනයකින් තොරව පැමිණිල්ල ලැබීමෙන් පැය 02 කට පසු අත්අඩංගුවට ගෙන ඇති බව අනාවරණය වේ. අත්අඩංගුවට ගැනීමට පෙර පැමිණිල්ල සත්‍ය පැමිණිල්ලක්ද යන්න සොයා බැලිය යුතු වුවත්, එවැන්නක් කර නොමැත.

සැකකරු බාලවයස්කාර දරුවකු වන අතර, අත්අඩංගුවට ගැනීමට පෙර ගරු මහේස්ත්‍රාත් වෙත කරුණු වාර්තා කළ හැකිව තිබූ නමුත්, එසේ නොකර අත්අඩංගුවට ගෙන ඇත. ඉන්පසුව වසර 02 කට ආසන්න කාලයක් තුළ ගරු මහේස්ත්‍රාත්වරයාට කරුණු දක්වමින් අපරාධය පිළිබඳව විමර්ශනය තවදුරටත් පැවැත්වෙන බව ප්‍රකාශ කළත්, අත්අඩංගුවට ගැනීමෙන් පසුව අපරාධය සම්බන්ධව කිසිදු විමර්ශනයක් කර නොමැත.

පැමිණිලිකාරියගේ පුත්‍රයාට එරෙහි BR 234/15 දරණ නඩුවේ ඩී.එන්.ඒ වාර්තා ලැබීමෙන් පසු වගඋත්තර නිලධාරීන් විසින් වින්දිත දැරියගෙන් 2016.06.15 වන දින නැවත ප්‍රකාශයක් ලබාගෙන ඇති අතර, එම ප්‍රකාශයෙන් ඇය අනාවරණය කර ඇත්තේ තමා පියා විසින් ඇය දූෂණය කළ බවයි. ඉන් අනතුරුව වගඋත්තර නිලධාරීන් එකී ප්‍රකාශය ලබාගැනීමෙන් පැය 04 කට පසු නැවත වින්දිත දැරියගේ පියා (දෙවන සැකකරු) අත්අඩංගුවට ගැනීමට පිටත්වී ඇති බව උද්ධෘත අනුව අනාවරණය වන අතර, එහෙත් එදින ඔහු නිවසේ නොසිටි හෙයින් පසුදින එනම් 2016.06.15 දින පෙ.ව 10.10 ට අත්අඩංගුවට ගෙන ඇත. ඉන්පසුව ඔහු අධිකරණයට ඉදිරිපත් කර පසුව රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් පසු 2019.07.30 දින එකී අපරාධයට ඔහු වැරදිකරු කර ඇති බව අනාවරණය වේ.

මේ අනුව වගඋත්තර පාර්ශවය විසින් අපරාධ පරීක්ෂණයකදී අනුගමනය කළ යුතු නිසි ක්‍රමවේදය අනුගමනය නොකරමින් මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බව අනාවරණය වේ. අපරාධයක් පිළිබඳව තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, ප්‍රශ්න කිරීම යන ප්‍රධාන පියවරයන් අනුගමනය කළ යුතු අතර, අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය ඉන් පසුව සිදුවිය යුත්තකි. එසේම මෙම පැමිණිල්ලේ 1 වන සැකකරු වන බාලවයස්කාර දරුවා බරපතල ස්ත්‍රී දූෂණ චෝදනාවකට විමර්ශනයකින් තොරව වහාම අත්අඩංගුවට ගෙන ඇති බව අනාවරණය වේ. ඔහු පාසල් ශිෂ්‍යයෙකු වන අතර, පරිවාස වාර්තා අනුවද ඔහු යහපත් දරුවෙකුද වේ. ඒ අනුව ඔහු පලායන සැකකරුවෙකු නොවන අතර මව්පියන් සමඟ එකට ජීවත්වීමට කැමැති දරුවෙකු බවද පරිවාස වාර්තා අනුව අනාවරණය වේ.

ඩී.එම් ඥාණවතී යන පැමිණිලිකාරියගේ පුත්‍රයා වන සාලිය ප්‍රසන්න යන අයගේ රුධිර සාම්පල වාර්තාව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2016.02.25 වන දින නිකුත් කර ඇති අතර, එය මොණරාගල මහේස්ත්‍රාත් උසාවිය වෙත හා සියඹලාණ්ඩුව පොලීසිය වෙත 2016.03.31 දින ලැබී ඇති

ඇත. මොණරාගල අධිකරණය විසින් නඩුවාර ගණනාවක් කැඳවා ඇතත්, සැකකාර පාසල් දරුවා නිදහස් කර ඇත්තේ, 2016.12.27 වන දින වන අතර, සැකකාර පාසල් දරුවා නිදහස් කරන ලෙස වගඋත්තර නිලධාරීන් ඉල්ලා ඇත්තේද 2016.12.15 දිනයි. ඒ අනුව ලේ සාම්පල වාර්තා ලැබීමෙන් පසු එකී වරදට සම්බන්ධයක් නොමැති සාලිය ප්‍රසන්න යන අය තවදුරටත් මාස 09 ක පමණ කාලයක් අධිකරණයට ඉදිරිපත් කර ඇති බව අනාවරණය වේ.

නිගමනය :-

01. පැමිණිල්ලට අදාළව සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු අනුව පැමිණිලිකාර ඩී.එම් ඥාණවතී යන අයගේ පුත්‍රයා වන සාලිය ප්‍රසන්න යන අයට එරෙහිව පැවැති චෝදනා පිළිබඳව කිසිදු පූර්ව විමර්ශනයක්, විශ්ලේෂණයක් සිදු නොකර හුදු ප්‍රකාශයක් මත පමණක් පදනම්ව වහාම අත්අඩංගුවට ගැනීම නීතිවිරෝධී බව කොමිෂන් සභාවේ මතයයි. එය 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහයේ අත්අඩංගුවට ගැනීමට අදාළ නීති උල්ලංඝනය කිරීමක් වන අතර, මෙම අත්අඩංගුවට ගැනීම හේතුවෙන් සැකකාර පාසල් ශිෂ්‍යයා මාසයක් පමණ රක්ෂිත බන්ධනාගාර ගතවීමට සිදුවීමෙන් ඔහු නීතිවිරෝධී රඳවා ගැනීමට ලක්වී ඇත. අත්අඩංගුවට ගැනීමට පෙර බාලවයස්කාර දරුවා පිළිබඳව මහේස්ත්‍රාත්වරයා වෙත කරුණු වාර්තා කර පියවර ගැනීමට හැකියාව තිබුනද වගඋත්තරකරුවන් එය පැහැරහැර අත්තනෝමතික ලෙස හුදු ප්‍රකාශයක් මත පමණක් අත්අඩංගුවට ගෙන ඇති අතර, ස්ත්‍රී දූෂණය සිදුවී මාස 04 කට පමණ පසුව ලැබුණු පැමිණිල්ල සත්‍ය අසත්‍යතාවය පිළිබඳව කරුණු සොයාබැලීමට අවශ්‍ය තරම් කාලය හා නීති ප්‍රතිපාදන පවතිද්දී එසේ නොකොට වගඋත්තර පාර්ශවයේ පොලිස් නිලධාරීන් වරද කළ බවට පූර්ව නිගමනයක පිහිටා සාලිය ප්‍රසන්න යන අය අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව නිරීක්ෂණය වේ.

02. සිය පියා නිසා දූෂණයට ලක්වී වින්දිතයෙක් බවට පත්වූ මෙම නඩුවට අදාළ බාලවයස්කාර දියණියට සිදුවූ බරපතල අපරාධය හා සමාන අපරාධයක් නිකරුනේ අත්අඩංගුවට පත්වීමෙන්, රඳවා තබාගැනීමෙන් සාලිය ප්‍රසන්න යන එවකට බාලවයස්කාර දරුවාටද සිදුව ඇති බවට නිරීක්ෂණය වන අතර, මේ හේතුවෙන් මෙම දරුවන් දෙදෙනාටම අධ්‍යාපනය ඇතුළු ළමා ප්‍රඥප්තිය හා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවද නිරීක්ෂණය වේ. සාලිය ප්‍රසන්න යන දරුවාට ඇප ලබාදීමෙන් පසු 2015.06.18 දින ඔහු වෙනත් පාසලකට ඇතුළත් කර අධ්‍යාපනය ලබා දීමට දෙමාපියන් කටයුතු කර ඇති අතර, එම පාසලේදීද එම දරුවා බරපතල හිංසනයට ලක්වී ඇති අතර, එවැනි තත්වයක් වැළැක්වීමට හා අපරාධ සිද්ධියකට හසුවී ඇති දරුවන්ගේ ආරක්ෂාව හා ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ රජයට ඇති වගකීම් ඉටු නොකිරීම හේතුවෙන් මෙය සිදුවී ඇති බවද කොමිෂන් සභාවේ නිගමනය වේ.

03. 1989 ජාත්‍යන්තර ළමා ප්‍රඥප්තිය ශ්‍රී ලංකාව විසින් 1991 වසරේදී අපරානුමත කර ඇති අතර, ඒ අනුව මෙම දරුවාට අධ්‍යාපනය ඇතුළු අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින් ප්‍රධාන වශයෙන්ම එහි වගකීම රජයට පැවරේ. ළමා ප්‍රඥප්තියෙන් පිළිගෙන ඇති අයිතිවාසිකම් සාක්ෂාත් කිරීම සඳහා ඊට අදාළ පොදු අදහස් (General Comments) අනුගමනය කිරීම ළමයින් සම්බන්ධව ක්‍රියාකරන සෑම අවස්ථාවකදීම අනුගමනය කළ යුතුය.

04. විශේෂයෙන්ම 2017 අංක 10 දරණ බාලකයුක්තිය පිළිබඳ පොදු මූලධර්ම ඉතා වැදගත් වන අතර, ළමයින් සම්බන්ධයෙන් අධිකරණ කටයුතු හා එම ක්‍රියාවලියේදී රාජ්‍ය පාර්ශවය සඳහා මාර්ගෝපදේශ සැපයීම මෙහි ප්‍රමුඛ අරමුණයි. ඒ අනුව ළමා ප්‍රඥප්තියේ 02 වගන්තියෙන් වෙනස්කම් නොකිරීම, 03 වගන්තියෙන් උපරිම යහපත සැළසීම, 06 වන වගන්තියෙන් ජීවත් වීම හා පැවැත්මට ඇති අයිතිය, සහ 12 වන වගන්තියෙන් දරුවන්ට සවන්දීම පිළිබඳ අයිතිය සාක්ෂාත් කිරීමේ අරමුණ ඇතුළත්ය.

05. පැමිණිල්ලට අදාළ සාලිය ප්‍රසන්න දරුවාට වගඋත්තරකරුවන් විසින් යම් පහරදීමක් කළ බව පැමිණිල්ලේ සඳහන් වන නමුත්, එම කරුණු පරීක්ෂණයේදී තහවුරු වී නොමැත. එහෙත් නොකළ වරදකට ඔහු බන්ධනාගාර ගතවීමට හා අධිකරණ ක්‍රියාමාර්ගයකට හසුවී ඇත. ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රියාවලිය තුළ එම දරුවා සිය චෝදනාවලින් නිදහස්වීම සඳහා දීර්ඝ කාලයක් ගත වී ඇති අතර ඒ අතරතුර ඔහුගේ ආරක්ෂාව, අධ්‍යාපනය, අහිමි වී ඇත. ඒ අනුව එම දරුවා වෙනස්කමකට භාජනය වී ඇති අතර, 'උපරිම යහපත' වෙනුවෙන් වගඋත්තර පාර්ශවය ක්‍රියාකර නොමැත. ඒ අනුව 2013 අංක 14 දරණ "උපරිම යහපත සැළසීම" පිළිබඳ පොදු මූලධර්මයන්හි (Best interest of the child) 2009 අංක 12 දරණ ළමයින්ට සවන්දීම හා ළමයාගේ මතය පිළිබඳ පොදු මූලධර්ම ඉතා වැදගත් වන අතර, එම මූලධර්ම හා සාලිය ප්‍රසන්න යන සැකකාර දරුවා සම්බන්ධ පොලිස් සහ අධිකරණ ක්‍රියාමාර්ග බරපතල ලෙස ගැටෙන බව නිගමනය කරයි.

නිර්දේශය :-

01. පැමිණිලි පාර්ශවයට සිදුවූ අගතිය වන්දි ගෙවීමකින් ප්‍රතිපූර්ණය කළ නොහැකි අගතියක් වන අතර, විශේෂයෙන්ම මෙම අගතිය සාලිය ප්‍රසන්න යන අය එවකට බාලවයස්කාර දරුවාට සිදුවී ඇත.

එබැවින් මෙය විශේෂ තත්වයක් ලෙස සලකා වගඋත්තර පොලිස් නිලධාරීන් වන ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්.කේ.ඩී ද සිල්වා, උ.පො.ප ජිනදාස යන නිලධාරීන් සහ එම ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා උපදෙස් ලබා දුන් පොලිස් අධිකාරී සුගත් ගලගමගේ යන නිලධාරි විසින් පැමිණිලි පාර්ශවය වෙත රු. 50,000/- ක වන්දි මුදලක් ගෙවන ලෙසට වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. එසේම නිසි විමර්ශනයකින් තොරව පුද්ගලයකු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගතකරමින් සිය නෛතික යුතුකම් පැහැර හැරීම සම්බන්ධයෙන් වගඋත්තර පොලිස් නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට පොලිස්පති වෙත නිර්දේශ කරනු ලැබේ.

2021 - 01 - 18 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත - 01. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. සභාපති,
අධිකරණ සේවා කොමිෂන් සභාව,
අලුත්කඩේ, කොළඹ 10.

B/